## උපන් දිනය
**ජයසේන කොඩිතුවක්කු,වත්තල**

අද වැනි සොඳුරු දිනයෙක හිමිදිරි උදයේ
වටිනම මැණික අම්මට මගෙ හිමි වූයේ
පෙර පින මට වගේ අම්මට බල පෑයේ
දෙන්නම අනු නවයෙන් බේරිලා තියේ

ගම්වල අපේ ඒ කාලේ අම්මලට
දරුවන් බිහි වුනේ ගෙදරදිමයි යසට
වින්නඹු මවක්වත් නැතිකොට උදව්වට
මවකට මවක් මේ මොහොතෙදි වෙයි පිහිට

කොහොම වුනත් නැණ ගුණ ඇති මගේ පියා
අම්මා කැටුව මාතර රෝහලට ගියා
දරු උපතට පමා ඇයිදැයි කරුනු සොයා
කළයුතු කුමක්දැයි තීරණ නැතිව ගියා

සීසේරියන්, ගැන දැනුමක් තිබුනෙ නැත
වීරිය සිතේ මවගේ පමණකි බෙහෙත
පියා ගොසින් දොස්තර හමුවූ මොහොත
ඇහුවම සසල විය නොදැනිම මගේ සිත

අවදානමක දෙන්නගෙ ජීවිත පාවේ
මවගේ ජීවිතය ගැන වැඩිපුර සිතුවේ
කිවයුතු දේ නොසඟවා දැන් කිවයුතුවේ
ඉවසීමෙන් සැනසෙන්න දොස්තර කීවේ

පෑවා මඳසිනා නොතකා කිසිම දෙයක්
කී වා ස්ථිරයි දෙන්නට නැහැ කරදරයක්
මේවා හඳහනෙන් ඔහු දැක තිබුන දෙයක්
නිවාරනයි හැම ග්‍රහ දොස් තුළදි රැයක්

අම්මා වේදනා ගුලි කර විඳින්නැතී
තාත්තා නිහඬවම දුක දරන්නැතී
දෙන්නගෙ පිනට මම අම්මට ලැබෙන්නැතී
දෙන්නම සිනාසී මම සිප ගන්න ඇතී

උපන් දිනය සමරන්නේ මම මෙහෙමයි
උතුම් දෙමව්පිය ගුණකඳ සිහිකරලයි
ඔවුන් විඳපු දහදුක මනසින් දැකලයි
නිවන් සුව පතා ඔවුනට පින් දීලයි

## අභිනික්මන
**මල්ලිකා ප්‍රනාන්දු - ලින්බෘක්**

කුරුලු තුඩින් පෑරුන හිත් පෙත්ත සියුම්
දුක රැඳී කදුළු ගංදිය රැලි ඉවුරු කඩන්
ද්වාරයේ පල්ලිය මැද සපථ කරන්
දෑඟිලි බැදුණු රන් හුය බැමි ලිහී ගිහින්

නුරා සර වැදී කිතිකැවුන මල් හිතේ
පුසුඹ නොබලාම කිමද පියබද නික්මුනේ
කොවුල් ගීතය නිහඬ ඇයි අද ගොම්මනේ
පවස නිවනා දියදෝ හමු වුනේ

කනට මුමුණා තෙපළු බද් දෙසවන රැදේ
නැඹුලේ පෙම තිඹිරි ගෙයි බිම වැළපුනේ
අභිනික්මනත් අමාවක සඳ ඒ වගේ

## හිනැහෙමු සෙනෙහෙ පපා
**ආනන්ද ගුණතිලක - හොපර්ස් ක්‍රොසිං**

නෑයෝ ඇතත් විපතකදී පිටු දකින
මිතුරන් එහෙම නැත බොහො දෙනෙකුට සිටින
සුළු අත් වැරදි දැනුනත් ඉඳහිට කෙරෙන
නිහඬව සමා දෙති - උන් දෙවියන් ලෙසින

ජනපති වරණ උණුසුම පැවතුනු අස්සේ
එහෙ මෙහෙ කෙරුනු එකිනෙක අදහස් ඔස්සේ
සමහර විටදි අපගෙත් වයිරය ඉස්සේ
ඒ ගැන පසු තැවුනෙ ටික දිනකට පස්සේ

බැණ අඬ ගසා ගත්තේ අපි මුහුණු පොතේ
මිතුරන් පිරිස සමගයි කෑ එකම පතේ
හැදුනත් කහට පැල්ලම් පොඩි - අපගෙ හිතේ
ගරු කල යුතුය ඒ අයගෙත් දරන මතේ

විවිධයි එකිනෙකා අපි - ලොව දකින හැටී
නුවණැති පිරිස ලෙස එය සිහි කෙරුම වටී
පලයක් නොමැත උනු'නුන් හා සමග ගැටී
සවියකි යෝද මිතුරන් ලඟ - එකට හිටී
මොන පසෙකට ගියත් මහ ජනයගෙ මතය
හැමගෙම පැතුම සිරිලක වැසියන් වෙතය
කාටත් අවැසි මවු බිම වෙත සිරි කතය
අප වෙහෙසුනෙත් ඒ ගැන බව දත යුතුය

හැම චන්දෙන්ම - එක පිරිසක් දිනාවී
පැරදුනු පිරිස් කඳුලැලි මත හඬාවී
සුන් උනු පැතුම් මත සුසුමන් හෙලාවී
අපි ඉමු නැවත - පෙර ලෙසටම හිනාවී

අපගේ වාද දෙස් පාලන මතය කපා
කිසි අයුරකින් හිතවත් කම් මතට නොපා
නැවතත් පෙරදි මෙන් හිනැහෙමු - සෙනෙහෙ පපා
අපි අපි අතරෙ මිතු දම නම් - නසනු එපා

## මල්
**එසන්දී අකිත්මා**
4 ශ්‍රේණිය
කුඩා කුසුම් බාලිකා විද්‍යාලය
(බණ්ඩාරවෙල)

ඕළු නෙළුම් මානෙල් මල්
පාට පාට ලස්සන මල්
සුවඳ හමන ලස්සන මල්
හරිම හැඩයි හරිම හැඩයි

## මගේ පුතුට
**සෝමසිරි දෙනගම**

නෙත සහතුටු කඳුළු ගඟේ
පාවී ආ අතට මගේ
දිමුතු රුවන් රන් පුතුනට
සරණ පතමි තෙරුවනගේ

සම්බුදු ගුණ රැස විහිදන
සෙන්කඩගල පුර ඉපදුන
පින්බර පුතු රැකදේවා
හැම දෙවියන් එක විලසින

මගේ රන්කැටි දිමුත පුතේ
ඔබට අනඟි රටක් ඇතේ
මෙවන් අනඟි රටක් දියත
නැති වග වියතුනගෙ මතේ

මහ මන්දිර දෙසට නොවේ
මගේ සිත අතු පැලටම වේ
යන හැඟුමින් පිබිදී ඔබ
දිළිඳුන් ගොඩ ගත යුතු වේ

ගුරුළුගෝමි විදු සක්විති
ගැමුණු විජයබා නරපති
සිරි රාහුල හිමි හෙළයෝ
දැනුදු මෙරට ජීවත් වෙති

මෙලෙස සදා ජීවත්වෙන
රහස කිමද කියා හැඳින
උපන් රටට වැඩ කර පුත
නමක් තබා මියයනු මැන



